# දිරිය ඇති



**සන්නස අරඹන නව විශේෂාංගයයි මේ. අපේ සමාජයේ ස්ව ශක්තියෙන් ජය ගත් දිරිය මිනිසුන් ගේ ගමන් මඟ අගය කිරීමත් ඔවුන් සමාජයට හඳුන්වා දීමත් අපේ අරමුණයි.**

මහින්දලාල් හේවාවසම් ඔස්ට්‍රේලියාවේ තෝමස්ටවුන් හි "කැන්ඩි ලූබ් ඔටෝ සර්විස් සෙන්ටර්" වාහන සේවා සැපයුම් ආයතනයේ අධිපතිවරයායි. වාහන අලුත්වැඩියාව හා නඩත්තු කිරීමට අදාල සියලු සේවාවන් නවීන තාක්ෂණානුකූලව හා විශ්වාසවන්ත ලෙස ඉටු කිරීම වෙනුවෙන් පැසසුම් ලද "කැන්ඩි ලූබ් ඔටෝ සර්විස් සෙන්ටර්" ආයතනය ගොඩ නගා සාර්ථක ලෙස පවත්වාගෙන යන මහින්ද ප්‍රදේශයේ සමාජ සේවා කටයුතු වලදීත් පෙරමුණෙම සිටියි. සන්නස ඔහු සමඟ පැවැත්වූ සාකච්ඡාවයි මේ.

මහින්ද
මම මුලින්ම පාසල් ගියේ ගෝනගල මධ්‍ය මහා විද්‍යාලයට. කුඩා කාලයේ සිටම කාර්මික අංශයට මගේ නැමුරුවක් තිබුණා. ඒ කාලයේ මට තිබුණ ක්‍රීඩා භාණ්ඩ අතර සෙල්ලම් වාහන වලට මම ආසා කළා. ඒ එක්කම පාසලේ අත්වැඩ වලදිත් ප්‍රදර්ශන වලදිත් මම වැඩපුරම අවධානය යොමු කළේ ඒ පැත්තට.

සන්නස
ඔබේ පවුලේ අනෙක් අය කාර්මික අංශයට නැඹුරුව හිටිය ද?

මහින්ද
නැහැ.. කවුරුත් හිටියෙ නැහැ.. නමුත් ඒ අය මට මම මේ ක්ෂෙත්‍රයට යොමු වීම ගැන සතුටු වුණා. මට සහය දුන්නා. අලුත අරන් දුන් සෙල්ලම් බඩුවක් ගලවා එහි ක්‍රියාකාරීත්වය සොයා බලන්න ගොස් කැඩී ගිය විට පවා ඔවුන්ගෙන් මට දොස් අහන්න වුණේ නැහැ. විශේෂයෙන් මගේ මව සහ පියා.

සන්නස
ඔබ කාර්මික ක්ෂෙත්‍රයට පිවිසුණේ කොහොමද?
මහින්ද
අප පාසල් යන වකවානුව වන විට ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය ආරම්භ කළා පමණයි. මම ඉල්ලුම් පත්‍රයක් දමා එයට ඇතුල් වුණා. 1978 - 82 කාලය තුළ කාර්මික අංශය පිලිබඳව පුළුල් දැනුමක් මේ ආයනය හරහා ලබාගන්න මට පුලුවන් වුණා. ඒ කාලයේ දැඩි විනයක් සහ ඉතාමත් උනන්දුවෙන් කැපවීමෙන් අපට ශිල්ප ලබා දෙන්න දක්ෂ ගුරුවරු හිටියා. මේ අවස්ථාවේදී ඒ අය මම ගෞරවයෙන් සිහි කරනවා.

සන්නස
කාර්මික අභ්‍යස ආයතනයේ අධ්‍යපනයෙන් පසුව ?

මහින්ද
මම දැනුම ලබාගන්න කීප තැනකම රැකියාවන්හි නිරත වුණා. ඊට අමතරව ඒ සම්බන්දව වැඩිදුර අධ්‍යපනය ලබාගන්නත් උනන්දු වුණා.

සන්නස
ඔබ ඔසට්‍රේලියාවට සංක්‍රමණය වුණේ මොන වසරෙද?






මහින්ද
මා සමග කීප දෙනෙක් 1990 ඔස්ට්‍රේලියාවට පැමිණියා. මේ වකවානුව වන විට ඔස්ට්‍රේලියාවේ රැකියා හිඟ කමක් තිබුණා. අපි රැකියා සොයා ගන්න පුදුම වෙහෙසක් දැරුවා. (දැන් කල්පනා කරන විට මේ වකවානුවේ මෙහෙට එන අය කොයි තරම් වාසනාවන්තද කියලා මට හිතෙනවා) ඒ කාලයේ මේ රැකියා විරහිතභාවය නිසා රජයෙන් විවිධ ක්ෂෙත්‍රයන්හි අධ්‍යපනය ලබාගන්න පහසුකම් සළසා තිබුණා. ඒ අනුව මම කැන්ගන් බැට්මන් ටේෆ් ආතනයට ඇතුල් වී නව තාක්ෂණය අනුව වාහන අලුත්වැඩියා කිරීම පිළිබඳව පුළුල් දැනුමක් ලබාගත්තා. ඒ දැණුම අපේ ඉදිරි ගමනට ලොකු අත්වැලක් වුණා.

සන්නස
ඉන් පසසෙ ඔබේම කියා ව්‍යාපාරයක් පටන් ගත්තද?

මහින්ද
නැහැ.. මං ඒ තරම් හදිසි වුණෙ නැහැ.. මුලින්ම 1994 අවුරුද්දෙ බන්ඩූරා වල ඇලන් කිං නිසාන් ආයතනයේ සේවය කළා. ඉන් පස්සෙ කෝබර්ග " ටොයෝටා ආයතනයේ සේවය කළා. මෙහෙම ඉන්නකොට මට හිතුණා මගේම වයාපාරයක් පටන් ගන්න. මුළින්ම මම කැන්ඩි ලූබ් නමින් මොබයිල් මිකැනික් සේවයක් පටන් ගත්තා. මගේ වාහනයෙන් තැන් තැන් වලට ගොස් සේවාදායකයන්ට අවශ්‍ය සේවය එතැනදීම කර දුන්නා.

සන්නස
කොයි තරම් කාලයක් මේක කළා ද?

මහින්ද
අවුරුදා එකහමාරක් පමණ. මට හිතුණා මේ ක්‍රමයට වඩා සාර්ථකව ස්තිර ව්‍යාපාරික ස්ථානයකදී සේවාදායකයනට හොඳ සේවයක් සපයන්නට හැකි බව. මොකද වාහනයකින් ගොස් සේවයක් කිරීමේදී අව්ව වැස්ස සීතල වැනි පාරිසරික හේතු බලපෑවා. ඒ එක්කම මට හිතවත් මගේ මිත්‍රයෝ කිව්වා තමන්ගේම කියලා ව්‍යාපාරයක් පටන් ගන්න. ඒ අනුව 2002 දී මම කැන්ඩි ලූබ් ආයතනය ආරම්භ කළා.

සන්නස
දැන් කැන්ඩි ලූබ් ආයතනයේ තත්වය කොහොමද?

මහින්ද
මේ වන විට අපේ ව්‍යාපාර කටයුතු ඉතා සාර්ථකව කරගෙන යනවා. ඉතාමත් කැපවීමකින් තමයි අපි මේ ආයතනය මේ තත්වයට ගෙනාවෙ. අපේ මූලික පරමාර්ථය තමයි සේවා දායකයන්ට පහසු මිලකට උසස් මට්ටමේ සේවයක් ලබාදීම. මන්දයත් බොහෝ වේලාවට අප හමුවට පැමිණෙන්නේ අපේම ශ්‍රී ලාංකික හිතවතුන්. ඔවුන්ට හැකි පමණින් සේවයක් කර ලැබෙන සතුට මිල මුදල් වලට වඩා වටිනවා. හැම තිස්සෙම අපි උත්සාහ කරන්නේ සේවා දායකයා සතුටු කිරීමයි.

සන්නස
ඔබේ පවුලේ විස්තරයක් කිව්වොත්

මහින්ද
මගේ බිරිඳ අසෝකා දුව එමල්කා පුතා විමුක්ති දුව ශානිකා
මේ අය තමයි මගේ පවුල . මෙයට අමතරව මගේ මව සහ අක්කලා දෙන්නෙක් හා මල්ලිලා දෙන්නෙකුත් ඉන්නවා. ඒ අය ලංකාවේ පදිංචියි.




මේ හැම දෙනාම මගේ සාර්ථකත්වය පිටුපසින් ඉන්න බව කියන්නම ඕනෙ.

සන්නස
ඔබ බොහෝ සමාජ සේවා කටයුතු වල යෙදෙන බවත් අප දන්නවා.

මහින්ද
ඔව්.. අපි අපට හැකි විදිහට අපේ සමාජයට සේවයක් කළ යුතුයි කියලයි මම හිතන්නෙ. මම පසුගිය කාලයේ විවිධ සමිති සමාගම් වල විවිධ නිල තල දැරුවා. දැනට ලක්මැදුර පදනමේ උපසභාපතිවරයකු ලෙස වැඩ කරගෙන යනවා. අපේ ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් ප්‍රජා නිවහනක් ගොඩ නගන්න අපි ලක්මැදුර පදනම මගින් උත්සාහ කරමින් ඉන්නවා. දැන් ඒ ගමනේ සෑහෙන ප්‍රතිඵල අපි අත්පත් කරගෙන තිබෙනවා.

ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියා ප්‍රාන්තයේ 2/40 Strong Av Thomastown Vic 3074 ලිපිනයේ පිහිටි කැන්ඩි ලූබ් ඔටෝ සර්විස් සෙන්ටර් ආයතනය අපේ දිරිය පුතෙකුගේ දිරිය දෑතින් ගොඩ නැංවී සහෝදර ජනතාවට සාධාරණ හා මනා ප්‍රමිතියකින් යුත් සේවාවක් පිරිනමන ආයතනයක් බවට පත්ව තිබෙනු දැකීම අප සැමගේම සතුටට කාරණයකි. මේ සාර්ථක ගමන පිලිබඳව මහින්ද හේවාවසම් නම් වන තරුණ ව්‍යවසායකයා වෙත සන්නසේ සුබපැතුම් මෙසේ පිරිනැමෙයි.

මහින්දගේ දුරකතන අංකය 03 9462 2199

7 වන පිටුවෙන් (රට වෙනුවෙන් )
සංගමයේ කාරක සභාව තීරණය කරනු ලැබීය. සිසු සිසුවියන්ගේ ශාරීරික ශක්තිය නැංවීමත් අධ්‍යාපනය සඳහා වන මානසික එකඟතාවයක් ඇතිකිරීමට ඇති හැකියාව, සෑම දිනකම පාසලට සිසුන්ගේ පැමිනීම වැඩිකර ගැනීමේ හැකියාව, එම ප්‍රදේශයේ ආර්ථික දුර්වලකම් නිසා දැනට පාසල් නොයන එහෙත් එම වයසේ පසුවන සිසුන් පාසලට අනුයුක්ත කර ගැනීමේ හැකියාව යන කරුණු සැලකිල්ලට ගනු ලැබූ අතර මේ වන විට මේ සියළු කරුණු සාර්ථකව සපුරා ගැනීමට හැකි වීම විශාල ජයග්‍රහනයක් ලෙස සටහන් කල හැකිය. ආරම්භයේදී පාසලේ ගොඩනැගිල්ලක කෙලවරක මෙම ආහාර සකසනු ලැබූ අතර වියහියදම් අවම කර ගැනීම සඳහා සිසු සිසුවියන්, දෙමව්පියන්, ගුරු මණ්ඩලය තම කාලය ශ්‍රමය මෙම ව්‍යාපෘතිය සඳහා මුසු කලෝය. පිඟන් කෝප්ප අවශ්‍ය ප්‍රමාණයට නොමැති වීමත් ඇතැම් විට එකම පතක සිසුන් දෙදෙනෙකු ආහාර ගන්නා අයුරුත්, එක් සිසුවකු තවත් සිසුවකුට ආහාර කවන අයුරුත් රූප රාමු මගින් දුටු සිඩ්නි වාසීන්ගේ දෑස් කඳුලින් තෙත් විය. ඒ නිසාම එම දරුවන් නැවතත් තනි කරන්නට ඔවුන්ට නොහැකි විය. ඒ නිසාම ඔවුන් නිව්සවුත්වේල්ස් හි ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය හරහා තම ඇති හැකි කම ඒ අහිංසක දරුවන් වෙස පසුගිය වසර කීපය තුල බෙදා හදා දුන්නේය. මේ මහා ව්‍යාපෘතියේ මේ වන විට ඉතිරිව ඇති එකම ශ්‍රී ලාංකික සමිතියක් මගින් ක්‍රියාත්මක වන අනු ව්‍යාපෘතියක් ලෙසින් තවමත් නොනැවතී ක්‍රියාත්මක වන්නට ගමක බලය සපයා දුන්නේ මෙම සිඩ්නි වාසීන්ගේ සහයයි.

මෙම සියළු උත්සහයන්ගේ ප්‍රතිඵල මේ වන විට එම සිසුන්ගෙන් දිස්වෙමින් තිබේ. මේ වන විට පාසලට පැමිනෙන සිසුන් සංඛ්‍යාව 600 කටත් වැඩිවී තිබේ. 1 වන වසරට සිසුන් 122ක් මෙම වසරේ ඇතුලත් කරගනු ලැබීය. මෙම විදුහලේ ගොඩනැගූ විද්‍යාගාරය, ගෘහ විද්‍යාගාරය නැරඹීමට ඒ අවට පාසල්වල සිසු සිසුවියන් ගුරුභවතුන් සමඟ පැමිනෙමින් සිටී. සමස්ථ ලංකා තරඟයේදී දේශීය නැටුම් සඳහා ප්‍රථම ස්ථානය ඔවුන් මෙවර දිනාගෙන තිබේ. දෙමව්පියන්ගේ බලකිරීමෙන් තොරව දරුවන් ස්ව කැමැත්තෙන් දිනපතාම සතුටෙන් පාසලට පැමිනෙමින් සිටී. පාසලේ අධ්‍යාපන කටයුතු වලට අමතරවා ක්‍රීඩා, නැටුම්, ගැයුම්, වැයුම් වැනි දේ සඳහා සිසුන් ඉදිරිපත්වෙමින් සිටී. ඒ සඳහා වූ තම උපන් හපන්කම් වල නිම් වලලු පුළුල්කරමින් සිටී.

මෙන්න මේ තත්වය යටතේ තමයි කලින් දිනකට රුපියල් 1000ක් පමණ වූ "පෝෂ්‍යදායක උදේ ආහාර වේලක්" සඳහා වන බරපැන දැනට රුපියල් 3000ක් වී තිබියදීත් ඉදිරියේදී ලෝක වෙළඳ පලේ තෙල් මිල ඉහල යාමත් සමඟ මීටත් වඩා වැඩි වේයැයි උපකල්පනය කර තිබියදීත් නිව්සවුත්වේලස් හි ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනීය ආදි ශිෂ්‍ය සංගමය මෙම ව්‍යාපෘතිය අත නොහැරම සිඩ්නි වාසීන්ගේ ආධාර උපකාර මගින් කරගෙන යාමට තීරණය කර ඇත්තේ.

මෙම ව්‍යාපෘතිය පිලිබඳව විදුහල්පති ධම්ම විලාස හිමි පැවසුවේ "මේ පලාතේ ඇත්තන්ගෙ ගෙවල් වල බතක් පිසෙන්නෙ කලාතුරකින්, ඉතින් මේ බත් ඇතළු ආහාර නිසා දිනපතාම ලමුන් පාසලට පැමිනෙනවා. ඒ නිසා අධ්‍යාපනය නොනැසී පවතිනවා. මෙහි ප්‍රතිඵලයක් ලෙස මෙවර ළමුන් තිදෙනෙකු ශිෂ්‍යත්ව විභාගය සමත් වෙලා තියෙනවා. ඒ වගේම මේ නොමිලේ ලැබෙන ආහාර වේල ලබා ගන්නා සමහරු දරුවන් දෙමව්පියන්ට තම සවි ශක්තියෙන් උපකාර කරනවා. පොදුවේ ලැබෙන උපකාර නිසා පාසල දියුණු වීම නිසා යමක් කමක් ඇති දරුවනුත් පාසලට ඇතුලත් වෙනවා. ඔවුන්ගේ හැකි කමත් මේ පාසලට දැන් දැන් ලැබීමට පටන් ගෙන තියෙනවා. කලින් එක පන්තියකටවත් ලමුන් නැති ශ්‍රේනි තිබුනත් දැන් 5 වන වසර හැරුණු කොට සෑම වසරකම පන්ති 2ක් හෝ වැඩි ගණනක් තිබෙනවා. පන්තියකට දරුවන් 60ක් පමණ සිටිනවා. ඒ අතරම මෙම විදුහලේ සිසු සිසුවියන්, අනපේක්ෂිත ස්වභාවධර්මයේ කුරිරු භාවයෙන් ඇති වූ තත්වයෙන් මිදෙමින් ඉතා අසීරු වූත් වඩා දුෂ්කර වූත් තත්තවයන් යටතේ අපේ කම, අපේ හැදියාව, අපේ පාරම්පරික උරුමයන් සහ සංස්කෘතිය රැකගනිමින්ම උසස් ප්‍රතිඵල ලොවට පෙන්නුම් කරමින් සිටිනවා. මේ තාක් බර පැන දැරූ සියළු දෙනාට බොහෝම පින්." අවසාන වශයෙන් එතුමා පවසා සිටියා.

ඉතින් මේ බාධක ජය ගැනීම සඳහා අතහිත දෙන සිඩ්නි වාසීන් සහ මෙම මහඟු කාර්යයට උරදීමට කැමති පිරිසක් අගෝස්තු 30 වන සෙනසුරාදා "දිය දෝතක්" පැදුරු සාදයක් සමගින් ඡැබබ්බඑ ඎසකකි ප්‍රජා ශාලාවේදී රාත්‍රී 7 ට හමුවීමට කටයුතු යොදා තිබේ. එහිදී මේ තාක් මෙම ව්‍යාපෘතිය ලැබූ ප්‍රගතිය පිළිබඳව නිපැයූ වීඩියෝ පටයකුත් ප්‍රදර්ශනය කෙරේ. ඉතාම පහසු මිලකට මෙහිදී ශ්‍රී ලාංකික ආහාර වේලක රස බැලිය හැකි අතර මෙම අනු ව්‍යාපෘතිය සඳහා දිනකට හෝ දින කීපයකට ආදී වශයෙන් දායකත්වය ලබා ගැනීමටද ඔබට අවස්ථ ාව සලසා තිබේ. වැඩි විස්තර සඳහා අමතන්න තිස්ස ඒකනායකට (0430045166)

පවස නොනවතින මහා සාගරයක් නොවී පවස නිවන "දිය දෝතක්" වීම කෙතරම් අගේදැයි අපට සිතුනේ මේ සිඩ්නි මෙල්බර්න් දෙනුවර අත්වැල් බැඳගෙන කෙරෙන දායකත්වය මගින් ඉදිරියට යන දික්වැල්ල උතුර මහා විද්‍යාලයේ සිසු සිසුවියන්ගේ නොපසුබට උත්සහය සහ එහි ප්‍රතිඵල දුටු විටය.